Australian Government
Department of Immigration and Border Protection

# ආගමන ඒජන්තවරයෙකු යොදාගැනීම පිළිබඳ උපදෙස්

## OMARA යනු කුමක්ද?

OMARA (Office of the Migration Agents Registration Authority) ආගමන දෙපාර්තමේන්තුවේ DIBP (Department of Immigration and Border Protection)හි කොටසකි. OMARA යනු ලියාපදිංචි ආගමන ඒජන්තවරුන් වශයෙන් මනා සහ සුදුසු පුද්ගලයන් පමණක් අනුමත වන බවට සහතික වන සහ එවන් ඒජන්තවරුන්ට එරෙහි පැමිණිලි විභාග කරන්නා වු නියාමක ආයතනයකි.

## ආගමන ඒජන්තවරයෙකු තෝරුගැනීම

- සියළු ආගමන ඒජන්තවරුනට තමාටම විශේෂිත ආගමන ඒජන්ත ලියාපදිංචි අංකයක්, හෝ MARN (*Migration Agents Registration Number*) ඇත.
- යම් පුද්ගලයකු ලියාපදිංචි වී ඇති බව OMARA වෙබ් අඩවියේ ඇති ඔවුන්ගේ MARN සෙවීමෙන් සහතික වශයෙන් දැනගත හැකිය.
- **යමෙකු ලියාපදිංචි ආගමන ඒජන්තවරයෙකු වුවද - ඔබට වීසා බලපතක් ලැබේද යන්න ඔවුනට සහතික කල නොහැක.**
- නිදහස් කොට ඇත්නම් හැර, OMARA සමග ලියාපදිංචි වී නොමැති කිසිවෙකු ආගමන උපදෙස් සැපයීම නීතිවිරෝධී වේ. නිදහස් කොට ඇති පුද්ගලයින්ගේ ලැයිස්තුවක් 956 පෝරමයෙන් දැනගත හැක.

## ආගමන ඒජන්තවරයකු යොදාගන්නා විට ඒ සඳහා අවවාද සහ උපදෙස්

### ඔබේ ආගමන ඒජන්තවරයා අනිවාර්යයෙන්:

- ඔබ වෙනුවෙන් කටයුතු කිරීමට එකඟ වු විට *පාරිභෝගික උපදෙස්* **(Consumer Guide)** හි පිටපතක් ඔබ වෙත ලබාදිය යුතුය. OMARA හි වෙබ් අඩවියෙන් ඔබටද එහි පිටපතක් ලබාගත හැක.
- ඔබ මුදල් ගෙවීමට පෙර ඔබෙන් මුදල් අයකරගන්නා සේවාවන් ලැයිස්තු ගතකල, *සේවාවන් පිළිබඳ ප්‍රකාශයක් (Statement of Services)* ඔබට ලබාදිය යුතුය.
- ඔබ ඉල්ලු පසු දින 7ක් ඇතුලත ඔබට අයත් ඕනෑම ලියවිල්ලක් අපසු ලබා දිය යුතුය.
- ඔබේ අයදුම්පත පිළිබඳ ඔබ සහ DIBP සමග කෙරෙන්නාවු සියළු සන්නිවේදනයන් හි වාර්තාවක් පවත්වා ගත යුතුය.

### ඔබ:

- ගමන් බලපත් සහ උප්පැන්න සහතික වැනි මුල් ලියකියවිලි ඔබ වෙත තබා ගත යුතුය. DIBP හට අවශ්‍ය සියළුම පාහේ ලියකියවිලි සහතික පිටපත් වශයෙන් ලබා දිය හැක.
- ඔබේ සාකච්ඡා සහ උපදෙස් ආගමන ඒජන්තවරයා වෙත ලිඛිතව ස්ථිර කලයුතුය. අන් අයෙකු පෝරමය සම්පූර්ණ කලද - DIBP වෙත සපයන තොරතුරු පිලිබඳව ඔබ වගකිව යුතුය.
- ඒජන්ත ගාස්තුවල කොටසක් වශයෙන් කිනම් සේවාවන් අඩංගුව ඇත්දැයි වටහා ගත යුතුය. දළ ඒජන්ත ගාස්තු වල ලැයිස්තුවක් OMARA හි වෙබ් අඩවියෙන් සොයාගත හැක.

## ඔබේ ආගමන ඒජන්තවරයා පිළිබඳ ගැටළු

- උපදෙස් අවශ්‍ය නම් OMARA අමතන්න.
- **පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම ඔබේ අයදුම්පත කෙරෙහි අනිසි බලපෑමක් ඇති නොකරයි.**
- දුරකථන අංක 1800 009 623 ඇමතීමෙන් ආගමන සහයයන් සපයන ලියාපදිංචි නොවු අය පිළිබඳව වාර්තා කල යුතුය.
- ඔබේ ආගමන ඒජන්තවරයාගේ සේවය තවදුරටත් අනවශ්‍ය නම් පෝරම අංක 956 හි B සහ C කොටස් සම්පූර්ණ කිරීමෙන් DIBP වෙත දැනුම් දෙන්න.

## යම් පුද්ගලයෙකු ලියාපදිංචි වී ඇති බව සැකහැර දැනගැනීමට: www.mara.gov.au වෙත පිවිසෙන්න.




## වැඩිදුර තොරතුරු

Office of the Migration Agents Registration Authority:
www.mara.gov.au හෝ
දුරකථන අංක : 1300 226 272

Department of Immigration and Border Protection:
www.border.gov.au හෝ
දුරකථන අංක : 131 881

අංක 131 450 ඔස්සේ භාෂණ පරිවර්තකයකු හා කතා කිරීමට පරිවර්තන සහ භාෂණ පරිවර්තන සේවාව (TIS) අමතන්න.